# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මෝටර් වාහන (සංශෝධන)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2019 මැයි මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 අප්‍රේල් මස 01 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[279 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 23.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 123 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අදාළ වාහනය පැදවීම සඳහා නීත්‍යානුකූල වයසට එළඹ සිටිනම් පමණක් මාර්ගයක සැහැල්ලු වාහනයක් හෝ බර වාහනයක් පැදවීම සඳහා එම තැනැත්තාට වගකීමක් පැවරීම සහ එකී විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දඩයක් පැනවීම සහ රියදුරු බලපත්‍ර නොමැතිව වාහනයක් පැදවීම සඳහා වන දඩ වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 141අ වන වගන්තිය ඇතුළත් කරනු ලැබේ. නව වගන්තිය මඟින් අධිවේගයෙන් ධාවනය කිරීම සඳහා දණ්ඩනයක් පනවනු ලැබේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 148අ වන වගන්තිය ඇතුළත් කරනු ලැබේ. නව වගන්තිය මඟින් දුම්රිය හරස් මාර්ගයක මාරුවීමේ දී ගත යුතු පූර්වාරක්ෂාවන් සඳහා විධවිධාන සලස්වනු ලබන අතර, එම වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන දණ්ඩනය පැනවීම සඳහා ද වන විධිවිධාන සලස්වනු ලැබේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 152අ වන වගන්තිය ඇතුළත් කරනු ලබයි. නව වගන්තිය මඟින් රිය ධාවනය අතරතුර ජංගම දුරකතනය ආදිය භාවිතය තහනම් කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන අතර, එම වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන දණ්ඩනය පැනවීම සඳහා වන විධිවිධාන සලස්වනු ලැබේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, විමෝචන සහතිකය සහ යෝග්‍යතා සහතිකයට අදාළ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන 224 වන වගන්තිය යටතේ වන පොදු දණ්ඩනය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනයෙන් පසුව මෝටර් වාහනයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් වන නියමිත දඩය වැඩි කිරීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ගාස්තුවක් සඳහා තැනැත්තන් ගෙනයාමට භාවිත කරනු ලබන මෝටර් වාහනයක් මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනයෙන් පසුව ධාවනය කිරීම සම්බන්ධයෙන් වන නියමිත දඩය වැඩි කිරීම වේ.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 216ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනයෙන් පසුව මෝටර් වාහනයක් ධාවනය කිරීමෙන් තැනැත්තකුගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් වන දඩය වැඩි කිරීම, සහ වරදෙහි විෂය පථය තවදුරටත් නියාමනය කිරීම මෙන්ම මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පාරිභෝජනයෙන් පසුව මෝටර් වාහනයක් ධාවනය කිරීමෙන් යම් තැනැත්තකුට තුවාලයක් හෝ බරපතළ තුවාලයක් සිදුකිරීම සම්බන්ධයෙන් වන දණ්ඩනය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නොසැලකිලිමත් ලෙස හෝ අනතුරුදායක ලෙස රිය ධාවනය සම්බන්ධයෙන් වන නියමිත දඩය වැඩි කිරීම වේ.

***11 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එම වගන්තිය රක්ෂණ සහතිකයක් නොමැතිව රිය පැදවීම සම්බන්ධයෙන් වන දණ්ඩනයෙන් ප්‍රතියෝජනය කරනු ලැබේ.

***12 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පොදු දණ්ඩනයට අවශ්‍ය වන්නා වූ වෙනස සිදු කිරීම වේ.

***13 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 141අ සහ 152අ වන වගන්ති සම්බන්ධයෙන් ස්ථානීය දඩ නියම කිරීම සඳහා අමාත්‍යවරයාට හැකිවීම වේ.

# මෝටර් වාහන (සංශෝධන)

එල්.ඩී.—ඕ. 53/2017

## (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2019 අංක  දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**203 වන අධිකාරයේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) එහි (අ) ඡේදයේ, එම ඡේදය අවසානයේ දැක්වෙන "තව ද" යන වචනය ඉවත් කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදයේ, එම ඡේදය අවසානයට "සහ" යන වචනය ඇතුළත් කිරීමෙන්;

(ඇ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) වයස අවුරුදු දහඅට සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් මිස මාර්ගයක සැහැල්ලු වාහනයක් ධාවනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු අතර, වයස අවුරුදු විසි එක සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් මිස මාර්ගයක බර වාහනයක් ධාවනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.".

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ -

(අ) එහි (අ) ඡේදයේ "රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් හයදහසකට නොවැඩි දඩයකට" යන වචනවල සිට එම ඡේදය අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.";

(ආ) එහි (ආ) ඡේදයේ "රුපියල් හාරදහසකට අඩු නොවන සහ රුපියල් අටදහසකට වැඩි නොවන දඩයකට" යන වචනවල සිට එම ඡේදය අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.";

(ඇ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, එහි (ඇ) ඡේදය වශයෙන් බලාත්මක විය යුතු, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් හතළිස් දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු

කරනු ලැබීමේ දී රුපියල් හතළිස් දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 141අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියට ඉක්බිතිව ම පහත අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 141අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"අධි වේගයෙන් රිය පැදවීම සඳහා වූ දණ්ඩනය.

141අ. (1) 140 සහ 141 වන වගන්තිවල විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී -

(අ) නියමිත වේග සීමාව සියයට විස්සක් දක්වා ඉක්මවන අවස්ථාවක දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට;

(ආ) නියමිත වේග සීමාව සියයට විස්ස ඉක්මවන සහ සියයට තිහකට අඩු අවස්ථාවක දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට;

(ඇ) නියමිත වේග සීමාව සියයට තිහ ඉක්මවන සහ සියයට පනහකට අඩු අවස්ථාවක දී රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පහළොස්දහසකට නොවැඩි දඩයකට; සහ

(ඈ) නියමිත වේග සීමාව සියයට පනහ ඉක්මවන අවස්ථාවක දී රුපියල් පහළොස්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට,

යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 140 වන සහ 141 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු, 215අ වන වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි ස්ථානීය දඩයන්ට ද යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 148අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 148අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"දුම්රිය මාර්ගය හරහා මාරුවීමේ දී පූර්වාරක්ෂාවන්.

148අ. (1) කිසිදු තැනැත්තකු විසින්–

(i) දුම්රිය ගේට්ටුව වසා ඇති විටෙක;

(ii) දුම්රිය සංඥා පද්ධති නොසලකා හරිමින්; හෝ

(iii) බලයලත් නිලධරයකුගේ විධානයන්ට කීකරු නොවෙමින්,

තමාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ආරක්ෂාවට අනතුරක් සිදුවීමට ඉඩ ඇති ආකාරයෙන් දුම්රිය හරස් මාර්ගය මත හෝ ඒ හරහා මෝටර් වාහනයක් නොපැදවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට සහ තුන්වන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් හතළිස්දහසකට නොඅඩු හා රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හා මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 152අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 152අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"මෝටර් වාහනයක් ධාවනය කරන විට ජංගම දුරකතනය ආදිය භාවිතය තහනම් කිරීම.

152අ. (1) කිසිදු තැනැත්තකු විසින්, මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය කරන විට දුරකතනයක්, ජංගම දුරකතනයක් හෝ වෙනත් යම් චංචල සන්නිවේදන උපකරණයක් භාවිත නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට මෙන්ම 215අ වගන්තිය යටතේ නියම කරන ලද ස්ථානීය දඩ මුදලකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(ඇ) මෙම උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තියේ "රුපියල් තුන්දහස් පන්සියයකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ මාස දෙළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තියේ "රුපියල් හාරදහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 216ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 216ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(අ) එහි (අ) ඡේදයේ "අවුරුදු දෙකකට නොඅඩු වූ ද" යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට," යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (අ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:–

"(ආ) ඒ තැනැත්තා විසින්-

(i) යම් තැනැත්තකුට තුවාලයක් සිදුකරන අවස්ථාවක, රුපියල් තිස් දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට; හෝ

(ii) යම් තැනැත්තකුට බරපතළ තුවාලයක් සිදුකරන අවස්ථාවක, රුපියල් පනස් දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට,

යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් එක්දහස් පන්සියයට නොඅඩු" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් විසිපන්දහකට නොවැඩි දඩයකට සහ දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට සහ තුන්වන වරට හෝ පසු වාරයක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමකට යටත් විය යුතු ය."; හා

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක්දහස් පන්සියයට නොඅඩු" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් විසිපන්දහකට නොවැඩි දඩයකට, හා දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ තුන්වනවරට හෝ පසු වාරයක දී

වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හා මාස හයක කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටවනු ලැබීමට,

යටත් විය යුතු ය.”.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“රක්ෂණ සහතිකය නොමැතිව රිය පැදවීම සඳහා වූ දණ්ඩනය.

218. 99 වන වගන්තියේ විධිවිධාන කඩකරනු ලබන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාසයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තියේ “රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු” යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට “රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් තුන්දහස් පන්සියයකට නොවැඩි දඩයකට ද දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ද, තුන්වන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි 10 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:–

"

| | *වගන්තිය* | *විධිවිධානය* |
|---|---|---|
| 10. | 140 හා 141 | - වේග සීමාවන්ට අනනුකූලව ධාවනය කිරීම |
| | 141අ (1) (අ) | - නියමිත වේග සීමාව ඉක්මවා සියයට විස්සක් දක්වා ධාවනය කිරීම |
| | 141අ (1) (ආ) | - නියමිත වේග සීමාව සියයට විස්ස ඉක්මවා සහ සියයට තිහට නොඅඩුව ධාවනය කිරීම |
| | 141අ (1) (ඇ) | - නියමිත වේග සීමාව සියයට තිහ ඉක්මවා සහ සියයට පනහට නොඅඩුව ධාවනය කිරීම |
| | 141අ (1) (ඈ) | - නියමිත වේග සීමාව සියයට පනහ ඉක්මවා ධාවනය කිරීම |

;";

(2) එහි 12 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කරනු ලබන අතර, එය එහි 12 (අ) අයිතමය ලෙස බලාත්මක විය යුතු ය:–

"

| | *වගන්තිය* | *විධිවිධානය* |
|---|---|---|
| 12 අ. | 152අ | - ජංගම දුරකතන භාවිතය මෝටර් වාහනයක් ධාවනය කරන විට තහනම් බව |

;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.